[illegible] [illegible] ධර්ම සාකච්ඡාවේ
[illegible] [illegible] [illegible] [illegible] [illegible]
[illegible] [illegible]



[illegible]

ගත් බුද්ධ වචනය පරම්පරාවෙන් පරම්පරාවට ආරක්ෂා කරගෙන ආවේ කටපාඩමින් හෙවත් ස්මෘති ශක්තියෙනි. වෛදික ආර්ය ජනයා වේදය ආරක්ෂා කරගෙන ආවේත් ඒ ක්‍රමයටය. එසේ කටපාඩම් කරගැනීමේදී භික්ෂූන් වහන්සේලා ආචාර්ය පරම්පරා අනුව ඒ කටයුත්ත සිදු කළහ. ප්‍රථම ධර්ම සංගායනාවේදී විනය පිටකය පිළිබඳව වගකීම භාරවූයේ උපාලි තෙරුන් වහන්සේටය.[2] ධර්මය භාරවූයේ ආනන්ද තෙරුන් වහන්සේටය. බුදුන් වහන්සේ දෙසා වදාළ ධර්මය චිරාත්කාලයක් ආරක්ෂා කරගනිමින් ඉදිරියට ගෙනයාම සඳහා පළමුවන සංගායනාව අවසානයේදී වැඩ පිළිවෙලක් ද යෙදුණි. එය නම් පෙර පැවති ක්‍රමය අනුව ස්මෘතියෙන් ධර්ම-විනය ආරක්ෂා කරගැනීමයි. නැත්නම් කටපාඩමින් එය ඉදිරියට ගෙනයාමයි. ඒ සඳහා සුදුසු භික්ෂූන් තෝරා ගනු ලැබුණි. ධර්ම-විනය වශයෙන් පිළිවෙලින් ආනන්ද හා උපාලි තෙරුන්ගේ ශිෂ්‍යයනට එකී වගකීම පැවරිණි. දීඝ, මජ්ඣිම, සංයුක්ත, අංගුත්තර යන නිකායන් ආනන්ද හිමියන්ට හා සාරිපුත්ත, මහාකාශ්‍යප යන මහ තෙරුන්ගේ ශිෂ්‍යයන්ට භාර වුණි. එසේම සාරිපුත්ත තෙරුන්ට අභිධර්මය භාර වූයේ යැයි සිතන්නට පුළුවන. ත්‍රිපිටකය ආරක්ෂා කරගැනීම පිණිස පැවරුණු කාර්ය භාරය නිසා එහි භික්ෂූන් භාණක හෙවත් භාණක තෙරුන් වශයෙන් ව්‍යවහාරයට පත් වුණි. මේ අනුව භාණකයන් දීඝ, මජ්ඣිම, සංයුක්ත , අංගුත්තර, ධම්මපද. මහා ආරියවංශ භාණකයන් වශයෙන් නම් දරා තිබුණි. පැරණි සිංහල ශිලා ලේඛනවල මජිමබණක, සයුතබණක, උතරබණක, සුතත, පෙළබණක ආදී වශයෙන් දැක්වෙන්නේ එවැනි අයයි.[3] භාණක හා පදභාණක නමින් තවත් කොටස් දෙකක නම් ද අපට හමු වේ. සුත්ත, විනය හා අභිධර්මය සහ පිටකත්‍රය ස්මෘති ශක්තියෙන් ගෙන ආවෝ භාණක වශයෙන් නොව සුත්තන්තිකා, විනයධරා හා අභිධම්මිකා යනුවෙන් හඳුන්වනු ලැබූහ. සුත්තන්තිකයන්ට කියූ තවත් නමක් වූයේ ධම්මධරා යන්නයි.[4] අටුවා කටපාඩමින් කියූවෝ අට්ඨකථිකා යනුවෙන් හැඳින්වූහ. තිපිටකා චතුනිකායිකා යනුවෙන් ද ඔවුන් හැඳින්විණ. දීඝභාණක - ත්‍රිපිටක මහාශිව නමැති තෙරුන් කෙනෙකු පිළිබඳ තොරතුරු සුමංගල විලාසිනියේ දැක්වේ.[5]

2 Paranavitana, S., ***Inscriptions of Ceylon***, Vol., pt. 1, Colombo, 1970, පිටු 117, 123, 104

3 Paranavitana, S., ***Inscriptions of Ceylon***, Vol., pt. 1, Colombo, 1970, පිටු 117, 123, 104

4 Adikaram, E.W., ***Early History of Buddhism In Ceylon***, Colombo, 1953, පි.24

5 එම, පිටුව 25, ***Sumangala Vilasini*** (PTS) II. pg. 543; III. pg. 883, 5-b, ***Manorathapurani***, (PTS), London, 1924, pg. 26.



සමන්ත පාසාදිකාවෙහි විස්තරවන පරිදි උපසම්පදාවෙන් දසවසක් වූ කෙනෙකු විනයට අයත් සමහර කොටස්වලට අමතරව දැන ගත යුතු කරුණු කිහිපයකි.[6] නිදසුන් වශයෙන්

1. මජ්ඣිම භාණකයෙකු නම් මජ්ඣිමනිකායේ පළමු සූත්‍ර පනහ දැන ගත යුතුය.
2. දීඝභාණකයෙකු නම් මහාවග්ගය දැන ගත යුතුය.
3. සංයුක්තභාණකයෙකු නම් මහාවග්ගය දැන ගත යුතුය.
4. අංගුත්තරභාණකයෙකු නම් එම නිකායේ පළමු හා පසු අඩ දැන ගත යුතුය.
5. ජාතක භාණකයෙකු නම් ජාතක පොතත් එහි අටුවාවත් එසේම ධම්ම පදයත් දැන ගත යුතුය.

ලක්දිව ශාසන වංශකථාවේ භාණක භික්ෂූන්වහන්සේලා පිළිබඳ බොහෝ තොරතුරු අටුවාවල මෙන්ම ශිලාලේඛනවල ද සඳහන් වේ. මේ සියළු දෙනා ආනන්ද හිමියන් ප්‍රමුඛ භික්ෂු පරම්පරාවෙන් දිගටම පැවත එන්නේ ද යන්න ස්ථිරව ප්‍රකාශ කළ නොහැකි වුවත් එසේ විය යුතු යැයි කල්පනා කළ හැකිය.[7] ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමෙන් පසුව වුවත් මෙකී භාණකයන්ගේ කාර්යය දිගටම පවත්වා ගෙන ගියා ද යන්න ස්ථිර වශයෙන්ම කිව නොහැකිය. පාලි සාහිත්‍යයේ සංගීති යයි කියන්නේ බොහෝ දෙනෙකු එකට එක්වී නැත්නම් එක්තැන් වී එක් වරම යම් කිසිවක් කටපාඩමින් කීමයි.[8] ප්‍රථම සංගායනාවේදී සිදු වූයේ බුදුන්වහන්සේ නොයෙක් අවස්ථාවලදී නොයෙක් තැනදී දෙසූ ධර්මය පන්සිය නමක් එකතු වී එකට කටපාඩමින් කීමයි.[9] එබැවින් එය ප්‍රථම සංගීතියයි.

සංගීතියක් පැවැත්වීමෙන් අදහස් කළේ බුද්ධ ශාසනය ඉදිරියට ද නොකඩවා නිරුපද්‍රිතව පවත්වා ගෙන යෑම පිණිස ව්‍යවහාරයේ පවත්නා ධර්ම - විනය දෙක බුද්ධභාෂිතයට එකඟදැයි පරීක්ෂා කර බැලීමයි. එය එක්තරා විධියකින් ධර්මධර - විනයධර භික්ෂූන් ලවා ගිවිස්වා ගැනීමකි. ශාසනයේ පැවැත්මට යම් බාධා ඇත්නම් ඒවා ඉවත්කර කල්පවත්වා ගැනීම පිණිස සසුන පිරිසිදුව පවත්වා ගැනීමත් ඒ මගින් සිදු විණ. මේ තත්වය පළමුවන දෙවන හා තුන්වන සංගායනාවලින් පැහැදිලි වේ. විනය අට්ඨකථාව වූ සමන්තපාසාදිකාවේ ද ඒ සිද්ධිය හොඳින් විස්තර වේ.

6 ***Samantapasadika***(sin.) II. 34,***Early History of Buddhism in Ceylon***,p. 25.

7 ***Early History of Buddhism in Ceylon***, p. 26

8 බුද්දත්ත හිමි, පොල්වත්තේ, *පාලි සාහිත්‍යය*, අම්බලන්ගොඩ, 1960

9 එම, පිටු 19-20

පළමු සංගායනාව සිදු කර ඇත්තේ බුද්ධ වචනය පිදීමටත් (භගවතො වචන පූජනත්ථං) තිථිකවාදයෙන් එය මුදවාලීමටත් ය. (තිත්ථියවාද පරිමොචනත්ථඤ්ච). දෙවන සංගායනාව පැවැත්වීමට හේතු වූයේ වෛසාලික වජ්ජිපුත්තක භික්ෂූන් විසාලායෙහි දශවස්තූන් දැක්වීම නිසායි. එමගින් බුදුන්ගේ ශාසනයට විපත්තියක් සිදු වෙතැයි ද (දසබලස්ස සාසන විපත්තිං සුත්වා) සිතූ ශ්‍රාවකයෝ අධර්මවාදීන්ට නිග්‍රහ කොට ධර්මය දක්වමුයි (අධම්මවාදිනො නිග්ගහෙත්වා ධම්මං දීපෙමිති) යන අදහස පෙරදැරි කරගෙන ධර්ම විනය සංගායනා කළහ.[10] තුන්වන සංගායනාවට හේතු වූයේ තිථිකයන් ලාභසත්කාර බලාපොරොත්තුවෙන් ශාසනයෙහි පැවිදිව ස්වකීය දෘෂ්ටිය දැක්වීම නිසාය. (ලාභසත්කාරංපත්තය මානං සාසනෙ පබ්බජිත්වා සකං සකං දිට්ඨිං පරිදීපෙස්සනකී එවං සාසනෙ මහන්තං අබ්බුදං උප්පජ්ජිස්සති) [11]

පළමුවන ධර්ම සංගායනාව බුද්ධ පරිනිර්වාණයෙන් තුන් මසක් ඉකුත්ව ගිය කල රජගහ නුවරදී අජාසත්ත රජුගේ අනුග්‍රහයෙනුත් දෙවන සංගායනාව බුද්ධ පරිනිර්වාණයෙන් අවුරුදු සියයක් ඉකුත්ව ගිය කල විසාලා නුවර දී කාලාශෝක රජුගේ අනුග්‍රහයෙනුත් තුන්වන සංගායනාව බුද්ධ පරිනිර්වාණයෙන් අවුරුදු දෙසිය තිස් පහක් ගිය කල පාටලීපුත්‍ර නගරයේදී ධර්මාශෝක රජුගේ අනුග්‍රහයෙනුත් පැවැත්විණ. මුල් සංගායනා දෙකේදී සම්මත වූ ථේරවාදී ත්‍රිපිටක ධර්මය තුන්වන සංගායනාවේදී ද අනුමත විය. බුදුන්වහන්සේගේ පරිනිර්වාණයෙන් අවුරුදු 236 ඉකුත් වූ කල ලක්දිවට වැඩම කළ මිහිඳු මා හිමියන් ප්‍රමුඛ සංඝයාවහන්සේ විසින් ශ්‍රී ලාංකික ජනතාව අතට පත් කරන ලද්දේ එසේ සංගායනා තුනකින් සම්මත වූ අටුවා සහිත ත්‍රිපිටක ධර්මයයි.

අප කවුරුත් දන්නා පරිදි මෙකී තෙවන සංගායනාවේ අවසානයේදී බැස ගත් තීරණයක් අනුව ප්‍රත්‍යන්ත දේශයන්හී බුද්ධ ධර්මය ප්‍රතිෂ්ඨාපනය කරනු කැමැත්තෙන් ඇරඹූ ධර්ම දූත ව්‍යාපාරයේ එක් ප්‍රතිඵලයක් වූයේ ලක්දිව බුදුදහම පිහිටු වීමේ අරමුණින් මිහිඳු මා හිමියන් ප්‍රමුඛ ධර්ම දූතයන් වහන්සේලා මෙහි වැඩමවීමයි. එසේ ලක්දිව ශාසනය ස්ථාපනය කිරීම පිණිස මුල් කාලයේදීම යෙදූ වැඩ පිළිවෙල අනුව උන්වහන්සේලා විනය පිටකය ද නිකාය පහ ද ප්‍රකරණ සත ද කියවූහ. (විනයං තෙ

10 *Samantapasadika*, pp. 159-160

11 එම, පිටුව 174



වාචයිංසු - පිටකං තම්බපණ්ණියා නිකායෙ පංච වාචෙසුං සත්ත චෙව පකරණේ). ලක්දිව ප්‍රතිෂ්ඨාපනය වීමට නම් ලක්දිව උපන් දෙමව්පියන්ට දාව උපන් දරුවෙකු ලක්දිවම පැවිදිව ලක්දිවම විනය ඉගෙන ලක්බිමම උගන්වන්නේ ද එදින ලක්දිව සසුන මුල්බැස ගන්නේ යැයි මිහිඳු හිමියන් එදා දේවානම්පියතිස්ස රජුට දුන් ඔවා අනුව අරිට්ඨ කුමරුගෙන් එම ශාසන ව්‍යාපාරය ආරම්භ විණ. මෙසේ ධර්ම විනය හදාරමින් ඇරඹුණු සංඝ ශාසනය පසුව දුටුගැමුණු වැනි නරවීරයන් යටතේ ශෝභාවට පත්වෙමින් ඉදිරියට ඇදී ආවේය. මේ අතර ක්‍රි. ව. පළමුවන සියවසේ ආරම්භයේදී එයට යම් යම් දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදු විණ. ධර්ම විනය ආරක්ෂා කරගනිමින් ඉදිරියට ඇදුණු සංඝ පරම්පරාවේ උගත් භික්ෂූන්ගේ නාම ලේඛනය .

තතො අරිට්ඨො මෙධාවි -තිස්සදත්තොච පණ්ඩිතො
විසාරදො කාල සුමනො - ථෙරොච දීඝ නාමකො
එතො නාගා මහාපඤ්ඤා -විනයඤ්ඤූ මග්ගකොවිදා
විනය දීපෙ පකාසෙසුං - පිටකං තම්බපණ්ණියා [12]

යනාදී වශයෙන් පැමිණියෝ කියුහයි සමන්තපාසාදිකාවෙහි සඳහන් වන්නේ එම උගත් ධර්මධර - විනයධර ආචාර්ය පරම්පරාවයි. අරිට්ඨ තෙරුන් වහන්සේගෙන් ආරම්භ වූ සිංහල සංඝ පරම්පරාව මෙසේ අනුරාධපුර මහාවිහාරය ද මුල් කරගෙන ත්‍රිපිටකය වාචෝද්ගත කර දෙවනපැතිස් මහ නිරිඳුන්ගේ අනුග්‍රහයෙන් හා අරිට්ඨ මහරහතන්වහන්සේගේ ප්‍රධානත්වයෙන් මිහිඳු මා හිමියන් අභිමුව ධර්ම සංගායනාවක් ද පැවැත්විය. එය අපගේ ශාසන ඉතිහාසයේ පස්වන සංගායනාව ලෙස සැලකේ. ඉන් පසු තවත් අවුරුදු 218ක් මුළුල්ලේ එකී අරිට්ඨ තෙරුන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව විසින් ථේරවාදී ත්‍රිපිටක ධර්මයත් අටුවාත් සම්බුද්ධ ශාසනයත් ආරක්ෂා කරගන්නා ලදී.

ක්‍රි. පූ. 103 දී අනුරාධපුරයේ දී රාජපදප්‍රාප්ත වට්ටගාමණී අභය රජුගේ කතා පුවත අලුවිහාර ධර්ම සංගායනාව හා සම්බන්ධ කරයි. ඉතිහාසය ලියවී තිබෙන ඒ ඉතිහාස පසුබිම පිළිබඳව අපි අවධානය යොමු කරමු.

ක්‍රි. පූ. දෙවන සියවසේ රජකළ දුටුගැමුණු රජතුමාත්, ඔහුගේ සොහොයුරු සද්ධාතිස්ස රජතුමාත් රාජ්‍ය විචාළේ මහාසංඝයා වහන්සේගේ උපදෙස් අනුශාසනා පරිදි

12 එම, පිටුව 181

බව කවුරුත් දන්නා කරුණකි.[13] එහෙත් සද්ධාතිස්සගේ මරණින් පසු සිහසුන සඳහා කෙනෙකු තෝරා ගැනීමේදී ඇමතියන් හා මහාසංඝයාවහන්සේ ථූපාරාමයට එක් රැස්වී තෝරා ගත්තේ සද්ධාතිස්සයන්ගේ දෙවැනි පුතා වූ ථූලත්ථනයි. ඔහුගේ වැඩිමහල් පුත්‍රයා වූ ලංජතිස්ස මේ වන විට සිටියේ රුහුණේයි. පියාගේ මරණින් පසු ඔහු අනුරාධපුරයට එන විට කටයුතු සිදු වී හමාරය. මසක් පමණ රජ කරමින් සිටි ස්වකීය සොහොයුරා පළවා හැර ඔහු රජකම සිය අතට ගත්තේය. ජ්‍යෙෂ්ඨත්වය හා යුතුකම ද නොසලකා හරිමින් ඇමති පිරිස හා මහාසංඝයා වහන්සේ කළ මේ කාර්යය ගැන ලංජතිස්ස බෙහෙවින් උරණ වී සිටියේය. කෙසේ වුවත් ඔහුගේ ආකල්ප වෙනස් කිරීමට මහාසංඝයාවහන්සේට හැකිවිය. ලංජතිස්ස රජ කළේ අවුරුදු 9 1/2ක් පමණකි. ඉන් පසු රජ වූයේ ඔහුගේ සොහොයුරු බල්ලාටනාගයි. ඔහුත් අවුරුදු 6ක් රජ කළේය. ඔහුගේ සොහොයුරා වූයේ වළගම්බා නමින් ප්‍රකට වට්ටගාමිණී අභය රජතුමායි. [14] ඔහු රජවූයේ සතුරන් පිරිවරාගෙනය. රජවී මාස පහකින්ම ඔහුට දෙපැත්තකින් තර්ජන ඇතිවිණ. එක් තර්ජනයක් ඇති වූයේ රෝහණ දේශයෙනි. එහි නකුල නගරයේ ජීවත් වූ තිය හෙවත් තිස්ස නම් බලසම්පන්න බ්‍රාහ්මණයෙක් රජවීමේ බලාපොරොත්තුවෙන් රජුට විරුද්ධව නැගී සිටියේය. දෙවන තර්ජනය ඇති වූයේ මේ අවධියේම පාහේ බල සෙනඟක් සමඟ මහාතිත්ථයට ගොඩ බට දෙමළ අධිපතීන් සත් දෙනෙකුගෙනි. දෙපාර්ශ්වයක් සමඟ සටන් වැදීමට වළගම්බා රජුට නොහැකි නිසා රජකමට තරග කරන දෙදෙනාට පළමුව සටන් වැදීමට ඉඩ හැරිය. තිස්ස බ්‍රාහ්මණයා රජුගෙන් සිහසුන ඉල්ලූ විට කියා සිටියේ පළමුව දෙමළුන් හා සටන් කර ඔවුන් විනාශ කළ හොත් රජකම දෙන බවය. ඒ අනුව සටන් වැදුණු තිස්ස සටන් බිමේදීම මිය ගියේය.[15] ඉන් පසු දෙමළ බල සේනා වළගම්බා රජු පළවා හැර සිහසුන අතට ගත්හ. රජතුමා පලා ගොස් වෙස්සගිරිය, සිලාසොබ්භ, ඛන්දක, මාතුවේලංග වැනි ස්ථානවල සැඟවිණ. මින් පසු පුලහත්ථ, පනයමාර, පිළයමාර ආදී වශයෙන් දෙමළ රජුන් අවුරුදු 14ක් හා මාස 7ක් අනුරාධපුරයේ රජ කළ බව පැවසේ. [16] මේ දමිළයන් පාණ්ඩ්‍යයන් විය හැකිය. ඉන් පසුව යළිත් වරක් දෙවන වරට වළගම්බා රජතුමා ක්‍රි.පූ. 89දී අනුරාධපුරයේ රජකමට පත්වූයේය.

ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ වූයේත්, අභයගිරි විහාරය ආරම්භ වූයේත් වළගම්බා රජතුමාගේ කාලය තුළය. මහාවංශයේ දැක්වෙන ඒ කතා පුවතට වෙනස් කථා පුවතකුයි

13 *University History of Ceylon*, Vol. 1, pt. 1, Colombo, 1959, පිටුව 164

14 එම, පි. 165

15 *Mahavamsa*, පරි. 33:41

16 සමරනායක, ඩී. පී. ආර්. (සංස්.), *නිකාය සංග්‍රහය*, කොළඹ, 1960, පිටුව 73



පාලි අටුවා කතාවෙන් පැවසෙන්නේ. පාලි අටුවා ලියැවුණේ මහාවංශය ලිවීමට මද කලකට පෙරදීය. එනම් පස්වන සියවසේදීය. එහෙත් මේ කථාව වෙනස් අයුරකින් ලේඛනගත වූයේ කුමන හෝ හේතුවක් නිසා විය යුතුය. පස්වැනි සියවසේදී අටුවාචාරී බුද්ධඝෝෂ හිමියන් විසින් ලියන ලද අභිධම්ම පිටකයේ විභංගට්ඨකථාව වූ සම්මෝහවිනෝදනියේ කියන්නේ වළගම්බා දෙවන වරට රජවීමට පෙර දහහතර අවුරුද්දක් රජ කළේ රුහුණේ කැරලිකාර බ්‍රාහ්මණ වූ තිස්ස හෙවත් තිය බවය.[17] දෙමළුන් රජ කළ කථාවක් එහි සඳහන් නැත. මේ කාලයේදී රටේ දුර්භික්ෂයකුත් ඇති වී යැයි කියනු ලැබේ. මහාවංශය එවැන්නක් ගැන සෘජුව සඳහන් කරන්නේ නැත. අටුවාවේ මේ දුෂ්කර වකවානුව සඳහන් කරන්නේ බ්‍රාහ්මණ තිය දුබ්භික්ඛ හා බ්‍රාහ්මණ තිය භය කියාය.[18] එලෙස සඳහන් කරන්නේ මේ බමුණාගේ කාලයේ පැවති අවුල් වියවුල් සහගත තත්වයත් අරාජික පාලනයක් හමුවේ ජනතාවට නොයෙකුත් විධියේ දුක්කම්කටොලුවලට මුහුණ පාන්නට සිදු වූ නිසාත්ය. එය දුර්භික්ෂයකට උපමා කර තිබේ. මෙයට හේතු වූ යුධ කාලයක් වූ නිසා මිනිසුන්ට ආහාර පානාදියේ හිඟ කම දැනෙන්නට වූ නිසාය. නියං කාලයකුත් ඒ අතර පවතින්නට ඇත. මේ සාගතය අවුරුදු 12ක් පැවති බව සහස්සවත්ථුපකරණය පවසයි. [19]

මේ දුර්භාග්‍යසම්පන්න කාලපරිච්ඡේදය බැමිණිටියාසාය නමින් හැඳින්වේ. එය දරුණු නියං කාලයක් ලෙසට හෝ දුර්භික්ෂයක් ලෙසට 14 වන සියවසේ ලියැවුණු සද්ධර්මාලංකාරයේ ද විස්තර වේ.[20] බමුණු-තිය සාය යන්න මෙසේ බැමිණිතියාසාය යනුවෙන් ව්‍යවහාර වන්නට ඇත. මහාවංශය බ්‍රාහ්මණ තිස්ස සාගතයක් ගැන සඳහන් නොකරන අතර කලි කාලයේ සත්වයන්ගේ ආයුෂ පිරිහීම නිසා ත්‍රිපිටකට ග්‍රන්ථාරූඪ කළ බව පමණක් මහාවංශ ටීකාව හෙවත් වංසත්ථප්පකාසිනියේ සඳහන් වෙයි. (සත්තානං හානි දිස්වාන තතො ඔළාරික කලිකාලෙ පරිහීනායුස සත්තානං පටි බුද්ධි පටිහීණ දිස්වා)[21] තිය බමුණාගේ කැරැල්ල ගැන සඳහන් කළ තැනේ ද මෙසේ එය කලි කාලය කියා හඳුන්වා ඇත්තේ පාපි - අධර්මිෂ්ඨ කාලයක් යන අරුතෙන් විය යුතුය. කලි යනු

17 *Sammohavinodani*, PTS (ed.), London, 1923, පිටු 445-446, ***University History of Ceylon***, Vol.i, pt.1, පිටුව 166, Colombo 1950

18 එම

19 බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, *සහස්සවත්ථුපකරණ*, බලංගොඩ, 1959, පිටු 1-41

20 සාරානන්ද හිමි, කළුතර (සංස්.), *සද්ධර්මාලංකාරය*, අභයථෙර වස්තුව හා රුක්ඛ දේවතා වස්තුව, කොළඹ, 1953, පිටු 596-600, 675-677

21 *Vansatthamalasini*, (PTS), London, 1985, පිටුව 453

පාප - අධර්මිෂ්ඨ යන අරුත් දෙයි. [22] මේ කාලයේදී ආහාර පානාදියක් හෝ නිසි ලෙස ලබා ගැනීමට නොහැකි වූ ධර්මධර - විනයධර භික්ෂූන්වහන්සේලාත් භාණක තෙරණුවන් වහන්සේලාත් ස්වකීය විහාරාරාමයන්ගෙන් නික්ම සමහරක් කඳුකරයටත් තවත් සමහරක් දඹදිවටත් වැඩම කළ හැටි විස්තර වේ.

දොළොස් අවුරුද්දක සාගතය හා අරාජික දේශපාලන යුගය අවසන් වී එතෙක් දඹදිවට වැඩ සිටි භික්ෂූන් යළි ලක්දිවට වැඩමවා මෙහි සිටි භික්ෂූන් සමඟ කල්ලගාම ජනපදයේ මණ්ඩලාරාමයට රුස්විය. [23] එසේ රුස්ව තමන් කටපාඩමෙන් රැක ගත් ධර්මය සසඳා බැලූ බවයි අංගුත්තරට්ඨකථාව හෙවත් මනෝරථපූරණිය පවසන්නේ. (මණ්ඩලාරාමක මහාවිහාරෙ ගන්ථකම්ම කරොම්.......) මණ්ඩලාරාමය කොහි තිබුණාදැයි කිව නොහැක. මෙය ග්‍රන්ථාරූඪ කිරීමේ අවස්ථාව නොව ධර්ම විනය සසඳා බැලීම් කළ අවස්ථාවයි. මෙහිදී තීරණය වූ තවත් වැදගත් කාරණයක් වූයේ සසුනට මූල, පර්යාප්තිය මිස ප්‍රතිපත්තිය නොවන බව පිළිගැනීමයි. ප්‍රතිපත්තිය යනු විදර්ශනා වැඩීමයි. ත්‍රිපිටක ධර්මය හැදෑරීම පර්යාප්තියයි. (සාසනස්ස මූලං උදාහු පටිපත්ති). මේ අනුව පිළිවෙත් පිරීම පසුබා ගිය අතර දහම් දෙසීම උසස් ලෙස සැලකුණි. විනය පරාජය වී සූත්‍ර ජයගත්තා යයි වල්පොල රාහුල හිමියන් පවසන්නේ ඒ නිසාය. මෙහි ප්‍රතිඵලය වූයේ ත්‍රිපිටකය ආරක්ෂා කිරීම වැදගත් කොට සැලකීමයි. මහා භය පැවති කාලයේදී මහානිද්දේසය ප්‍රගුණ කර තිබුණේ එක් භික්ෂුවක පමණි. ඒ භික්ෂුව ද දුශ්ශීලයෙක් වූයේය. එනු නිකායික තිස්ස මහ තෙරුන්ගේ උපාධ්‍යාය ස්ථවිරයන් මහාරක්ඛිත නමැති තෙරුන්ට ඒ භික්ෂුවගෙන් ඉගෙන ගන්නට සැළැස්වී යැයි විනය අටුවාවේ තිස්සග්ගිය වණ්ණාවෙහි දක්වා තිබේ. මෙයින් පෙනෙන්නේ ද ධර්මය රැකීම විනය රැකීමට වඩා වැදගත් වූ වගයි. [24]

දහහතර අවුරුදු හත් මසකට පසුව දෙවැනි වරට රජ වූ වට්ටගාමණී සිහසුන අහිමි වී සිටි කාලයේදී තමා රැක බලා ගනිමින් උදව් උපකාර කළ කුපික්කල මහා තිස්ස නම් තෙරුන් සඳහා අභයගිරි නමින් විහාරයක් ඉදි කළ සැටි වංශ කථාව විස්තර කරයි.[25]

22 *සිංහල ශබ්දකෝෂය*, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ, 1982, 5 වෙළුම 25 භාගය, 2437 පිටුව

23 *මනෝරථපූරණී, අංගුත්තර නිකායට්ඨකථා*, හේවාවිතාරණ (සංස්.). පඨම භාගය, කොළඹ, 1923, 22 පිටුව, ***Manorathapurani*** (PTS), Vol.1, පි. 38, London, 1924

24 බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, *පාලි සාහිත්‍යය*, 22 පිටුව

25 *මහාවංශය*, 33: 80-82



පුද්ගලික දේපොළ පිළිගැනීම අකැප යැයි වාද කළ මහාවිහාරයික භික්ෂූන් විසින් මහාතිස්ස හා අනුගාමික පිරිස ස්වකීය විහාරයෙන් පළවා හරින ලදි. මේ නිසා මහාවිහාරයෙන් බිඳී අභයගිරි නමින් තවත් විහාරයක් මෙන්ම නිකායක් ඇති වුණි. එසේම වෛතුල්‍ය වාදයට නැඹුරු ආචාර්ය පරම්පරාවක් ඇති වීමට ද මෙය හේතු විණ. නිකාය සංග්‍රහයේ එන තොරතුරු වළගම්බා රජු හා එකල සිද්ධීන් සටහන් වූ වංශ කථා පුවත්වලින් බෙහෙවින් වෙනස්ය. නිකාය සංග්‍රහය පවසන පරිදි ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ වූයේ වළගම්බා රජු වල්වැදී සිටි කාලයේදී පැවති සාගතයේදීය. [26] කෙසේ වුවත් දඹදිව පල්ලරාරාමයේ සිට පැමිණි වජ්ජිපුත්ත තෙරුන් වහන්සේලා නිසා අභයගිරියට ද නව ජීවයක් ලැබුණි. මේ භික්ෂු පරම්පරාව පැවත ආයේ තුන්වන ධර්ම සංගායනාවේදී මොග්ගලීපුත්තතිස්ස හිමියන්ට විරුද්ධ වූ ධර්මරුචි තෙරුන්ගෙනි. අභයගිරියට ධර්මරුචි නිකාය යැයි නම් තැබුවේත් ඒ හේතුවෙනි. මහාතිස්ස හිමි ආචාර්ය ධර්ම රුචි නමින් පසුව ප්‍රසිද්ධ විණ.[27]

මණ්ඩලාරාමයේදී ධර්මය සසඳා බලන ලද්දේ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමෙන් පසුව යැයි අංගුත්තර අටුවාව ප්‍රකාශ කරන නිසා එය වළගම්බා රජු වල් වැදී සිටි මුල් අවුරුදු දොළහෙන් පසුව යැයි සිතන්නට පුළුවන. නිකාය සංග්‍රහය පවසන්නේ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන ලද්දේ වළගම්බා රජු දෙවැනි වර රජ වන්නට තුදුස් වර්ෂ සත් මසකට පෙර බවයි. [28] ඒ අනුව සලකතොත් ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ වූයේ සංගීතිය පැවැත්වූ කාලයත් වළගම්බා රජු දෙවන වර රජවීමත් අතර පැවති දෙවර්ෂ සත් මසක කාලය තුළදී යයි සිතන්නට පුළුවන. වළගම්බා රජු අභයගිරි විහාරය කරවූයේ දෙවන වරට රජ වූවායින් පසුවය.

ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ වූයේ කිනම් කාලයකදී ද යන ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා පිළිවෙළින් හතරවැනි හා පස්වැනි සියවස්වලට අයත් වන දීපවංශය[29] හා මහාවංශය[30] එකතුව ප්‍රකාශ කරන එකම ස්වරූපයේ විස්තරය ද අපට වැදගත් වේ. මෙය වට්ඨගාමිණී රජුගේ විස්තරයට නොගැළපෙන එකක් බවත් එය පසුව එක් කළ ගාථා

26 සමරනායක, ඩී. පී. ආර්. (සංස්.), *නිකාය සංග්‍රහය*, කොළඹ, 1960, 73 පිටුව

27 Malalasekera, GP. ***The Pali Literature of Ceylon***, Colombo, 1973, p. 42

27. Malalasekera, GP. ***The Pali Literature of Ceylon***, Colombo, 1973, p. 42

28. *නිකාය සංග්‍රහය*, 73 පිටුව

29 ඤාණවිමල හිමි, කිරිඇල්ලේ (සංස්.), *දීපවංශය*, කොළඹ, 1970, පරි. 20: 20:21

30 බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (සංස්.), *මහාවංශය*, කොළඹ, පරි. 33: 102-103

දෙකක් බවත් විශ්වාස කරන පඩිවරුද සිටිති. දීපවංශයේ හා මහාවංශයේ ඇති එකම විධියේ ගාථා දෙක මෙසේයි.

පිටකත්තය පාලිඤ්ච තස්සා අට්ඨකථා පිච
මුඛපාඨේන ආනෙසුං පුබ්බෙ භික්ඛු මහාමති

හානිං දිස්වාන සත්තානං තදා භික්ඛු සමාගතා
චිරට්ඨිතත්ථං ධම්මිස්ස පොත්ථ කෙසු ලිඛාපසුං

එහි අදහස නම් :

මහා ප්‍රඥා ඇති භික්ෂූහු පිටකත්‍රය පාළිය හා අට්ඨකථා ද මුඛපාඨ වශයෙන් හෙවත් වාචෝද්ගත භාවයෙන් ම රැක ගෙන ආහ.

නැවතත් අනාගතයෙහි සත්වයන්ගේ හානිය දැක ශ්‍රී සද්ධර්මයාගේ චිරස්ථිතිය පිණිස පුස්තකයන්හි ලියූහ යන්නයි..

නවවැනි සියවසේ අගභාගයට තරම් අයත් මහාවංශ ටීකාව හෙවත් වංසත්ථප්පකාසිණිය අර කියූ සත්ත්වයන්ගේ හානිය විස්තර කරන්නේ මැන කලියුග කාලයෙහි පිරිහී ගිය ආයුෂ ඇති සත්ත්වයන්ගේ බුද්ධි පරිහානිය දැක යි ටීකා කරමිනි.[31] ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමට හේතු වූ කාරණය ඒ පාඨයෙන් පැහැදිලි වේ. බුද්ධිමය වශයෙන් පිරිහෙන සත්ත්වයාගේ පරාභවය දැක සද්ධර්මය ආරක්ෂා කිරීම පිණිස පිටකත්‍රය ග්‍රන්ථාරූඪ කළ බවයි.

දීපවංශය හා මහාවංශය ලියැවුණු කාලයේ පැවති විශ්වාසය හා අවබෝධය අනුව ග්‍රන්ථාරූඪ කිරීමේ සිද්ධියට ප්‍රමුඛත්වයක් දී තිබේ. සිදු වූ ස්ථානය ගැන සඳහන් කිරීමේ අවශ්‍යතාවක් වංශ කථා කරුට තිබුණේ නැත. සංගායනාව සිදු වූ ස්ථානය කවුරුත් දැන සිටි ස්ථානයක් වීම නිසා විය යුතුය. දහතුන්වන සියවසේ ලියූ පූජාවලිය [32] කියන්නේ මොවුන් (වළගම්බා) දවස පන්සියයක් රහතන් වහන්සේ අලු ලෙන වැඩ හිඳ

---

31 *වංසත්ථප්පකාසිනී*, සිංහල අනුවාදය අකුරැටියේ අමරවංශ හිමි හා හේමචන්ද්‍ර දිසානායක, කොළඹ, 1994, 500 පිටුව

32 අමරමෝලි හිමි, වේරගොඩ (සංස්.), *පූජාවලී*, කොළඹ, 1953, 773 පිටුව



පොත් සංගායනා කළ සේක කියාය. දහහතර වැනි සියවසේ ලියැවුණු නිකාය සංග්‍රහය [33] විනයධර උපාලි තෙරුන්ගෙන් ආරම්භව තිස්අට දෙනෙකුගෙන් සමන්විත ආචාර්ය පරම්පරාවක නම් හෙළි කරමින් මුඛපාලි වශයෙන් ගෙන ආ ත්‍රිපිටක ධර්මය එක්තරා ජනපදාධිපතියෙක්හුගේ ආරක්ෂායෙන් පන්සියයක් මහරහතුන් වහන්සේ මාතුල නම් දනව්වෙහි අලුලෙන වැඩ හිඳ පොත් සංගායනා කොට ලියවූ සේක කියායි. පසුකාලීන මූලාශ්‍ර වශයෙන් සැලකෙන සද්ධර්මරත්නාකරය රාජරත්නාකරය අස්ගිරි තල්පත යනාදි කෘතීන්ට ආභාසය වී ඇත්තේ ද නිකාය සංග්‍රහයේ එන කෙටි විස්තරය බව පෙනේ.

මේ තොරතුරුවලින් පැහැදිලි වන්නේ ප්‍රථම වරට ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ වීම ක්‍රිස්තු වර්ෂ පළමුවන සියවසේ වට්ටගාමිණී අභය රජතුමන්ගේ දෙවන රාජපදප්‍රාප්තියට ආසන්න කාලයේදී සැකයෙන් තොරව සිදු වූ බවකි. යම් ස්ථානයකින් ධර්මාලෝකය ලොව පුරා විහිදුනාද ඒ ස්ථානය ආලෝක ලෙන යයි පසුකාලයේදී එනම් දහතුන්වැනි සියවසේ දී තරම ව්‍යවහාරයට පැමිණුනා යැයි සිතන්නට පුළුවන. එම ස්ථානය කුමක්ද යන්න තවදුරටත් තහවුරු කිරීමට දාහතරවැනි සියවසේදී මාතුල ජනපදය හෙවත් මාතලේ යන කොටස එකතු කරන්නට ඇත්තේ නිරවුල්ව අලුලෙන හඳුනා ගැනීමට විය යුතුය. එබැවින් වර්තමාන මාතලේ අලුවිහාරය වුකලී ක්‍රිස්තු වර්ෂ පළමුවන සියවසේදී ත්‍රිපිටකය ප්‍රථමවරට ග්‍රන්ථාරූඪ වූ ඓතිහාසික වූත් පූජනීය වූත් පුණ්‍ය භූමිය බවට කිසිදු සැකයක් නැත. අලුවිහාරයේ අදත් දක්නට ඇති ක්‍රිස්තු පූර්ව යුගයට අයත් බ්‍රාහ්මී ලෙන් ලිපිවලින් මෙම ස්ථානයේ වැදගත්කම වටහා ගන්නට පුළුවන.

මෙකී කාරණාව සම්බන්ධයෙන් මෙතෙක් පැවති විශ්වාසයන්ට හා සම්ප්‍රදායන්ට පටහැනි විස්තරයක් අස්ගිරි තල්පතින් කියැවේ. එනම්

> කටපාඩමින් ගෙන ආ ත්‍රිපිටක ධර්මය කල්ලගාම නම් ජනපදයේ මණ්ඩලාරාමයේදී සංසන්දනය කළ බව අංගුත්තර නිකාය කථාව සඳහන් කරන අතර අස්ගිරියේ තල්පතේ කියැවෙන්නේ එය පංචමහා විහාරයේ භික්ෂූන් ලෝවාමහාපායට රැස්ව ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමේ අවශ්‍යතාව ගැන තීරණයක් ගත් බවයි. ඒ කාලය වන විට අනුරාධපුරයේ සංඝාවාසයක් තිබුණේ ද නැත. දෙවනුව අලුවිහාර සංගායනාවේදී මූලසූත ගත්තේ නිකාය සංග්‍රහයෙන්ද පැවසෙන තොරතුරු අනුව ශිව නම් ස්ථවිර

---

33 *නිකාය සංග්‍රහය*, 73 පිටුව

කෙනෙකි. එහෙත් අස්ගිරි තල්පතේ ඒ වෙනුවට නම්කර ඇත්තේ ථූපාරාම නිවාසී කුන්තගත්ත තිස්ස මහරහතුන් වහන්සේ කෙනෙකි. උන්වහන්සේ කවරෙක්ද යන්න හඳුනා ගැනීමට ක්‍රමයක් නැත.[34]

එසේම මෙම සංගායනාව අභයගිරි විහාරය ආරම්භ කිරීමෙන් පසු එනම් තිස්ස තෙරුන්ගේ විනය විරෝධී ක්‍රියාවෙන් පසු මහාවිහාරික භික්ෂූන් විසින් සංවිධානය කරන ලද්දක් බව කීමත් අස්ගිරි තල්පතේ ඇති තවත් එබඳුම අලුත් ඉතිහාස කරුණකි. එතෙක් පැවති විශ්වාසය වූයේ අභයගිරි විහාරය ආරම්භ කිරීමට පෙර එනම් දුර්භික්ෂයෙන් පසු නොයෙක් තැන විසිරී සිටි භික්ෂූන් වහන්සේලා ත්‍රිපිටකය මුඛ පරම්පරාවෙන් ආරක්ෂා කරගෙන අවුත් ආලෝක ලෙනෙහි වැඩ හිඳ සංගායනා කොට ග්‍රන්ථාරූඪ කළ බවයි. ඒ නිසා අස්ගිරි තල්පතේ එන වැඩි විස්තරය නිරවද්‍ය වාර්තාවක් ලෙස පිළි ගැනීම දුෂ්කරය. අලුවිහාරය වූකලී අස්ගිරි මහා විහාර පාර්ශවයේ පන්සලක් වීමත් අස්ගිරි තල්පත නමැති මේ ලේඛනය අවුරුදු සියයකට වඩා පැරණි නොවන නිසාත් එම විස්තරය ප්‍රතික්ෂේප කිරීමට සිදු වේ. එහෙත් එයින් අදහස් වන්නේ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමත් අලුවිහාරයත් අතර ඇති සම්බන්ධතාවට හානියක් වෙනවා යන්න නොවේ. ඇත්ත වශයෙන්ම නවතම පර්යේෂණ මගින් සිදුවී ඇත්තේ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම හා අලුවිහාරයත් අතර ඇති සම්බන්ධතාව තවත් තහවුරු වීමයි.

මෙහි මුලදී සඳහන් කළාක් මෙන් දෙමළ ආක්‍රමණිකයන් නිසා වට්ටගාමණී අභය හෙවත් වළගම්බා රජු පලාගියේ වෙස්සගිරියට බව මහාවංශය පවසයි.[35] එම වෙස්සගිරිය වර්තමානයේ වෙස්සගිරියයි හඳුන්වන අනුරාධපුරයේ ඇති ස්ථානය විය නොහැකියි. එය අද ඉසුරුමුණි ප්‍රදේශය බව නිවැරදිව හඳුනා ගෙන තිබේ. වර්තමාන ඉසුරුමුණිය පැරණි මේඝගිරි විහාරයයි. එසේම වළගම්බා රජු පලා ගොස් සැඟවුණු වෙස්සගිරිය කොහි පිහිටියේද? මේ ගැන සෙවීම ආරම්භ කළේ මහාචාර්ය සෙනරත් පරණවිතානයි. දඹුළු විහාරය පිහිටා ඇති ප්‍රදේශය ක්‍රිස්තු පූර්ව දෙවන සියවසේදී තරම හඳුන්වා ඇත්තේ වාතවත යන නමින් බව එහිදී සොයා ගත් සද්ධාතිස්ස යුගයට අයත්

34 රෝහණධීර, මැන්දිස් (සංස්.), *අස්ගිරි තල්පත*, කොළඹ, 1969, 2-3 පිටු අලුවිහාරයේ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම, *ඓතිහාසික මාතලේ*, මාතලේ දිසා සංස්කෘතික මණ්ඩලය, රජයේ මුද්‍රණාලය, 1984, 127-130 පිටු

35 *මහාවංශය*, පරි. 33:48



සෙල්ලිපියකින් පෙනේ.[36] වාතපබ්බතයක් ගැන දේවානම්පියතිස්ස යුගයේදී කියැවේ. මනෝරථපූරණියේත් එය සඳහන් වේ.[36B] මේ වාතපබ්බතය පිහිටා ඇත්තේ අනුරාධපුරයට දකුණු දෙසින් බව වංශකථා පවසයි. එහි දුර ප්‍රමාණයත් දක්වා ඇත. පුරාණ ජඹකොල හෙවත් දඹුල්ලේ නම විශ්වගිරි බවත් එය පාලි බසින් හඳුන්වන ලද්දේ වෙස්සගිරිය බවත් පරණවිතාන පවසයි. පස්වන සියවස වන විට දඹුළු විහාරය විශ්වගිරි - වෙස්සගිරිය වශයෙන් නම් ලබා තිබූ අතර දේවානම්පියතිස්ස රජු විසින් ධර්මාශෝක රජුට යැවූ වේළු යෂ්ටීන් සපයාගත්තේ ද එදා වාතපබ්බත වශයෙන් හැඳින්වුණු විශ්වගිරියෙන් බව ඔහු තර්ක කරයි. මේ මතය පිළි ගැනීමට තරම් සාධක නොතිබුණ ද වළගම්බා රජු සතුරන්ගෙන් මිදී පලා ගියේ අනුරාධපුරයේ ඇති වර්තමාන වෙස්සගිරියට නම් විය නොහැක. දඹුල්ලේ වට්ටගාමණී අභය රජුගේ සෙල්ලිපියක් ද ඇති බව අමතක නොකළ යුතුය. මහාවංශයම පවසන පරිදි වෙස්සගිරියට පලා ගිය වළගම්බා රජු එතැනින් ශිලා සොබ්භබන්දනයට :ගල්හෙබකඩ- ගිය බවත් ටීකාව ප්‍රකාශ කරයි. එය වෙස්සගිරියට දකුණෙන් පබ්බත විහාරය අභියස පිහිටා තිබූ බව කියැවේ. එතැනින් ඔහු පලා ගොස් ඇත්තේ මාතුවෙලංග නම් දනව්වෙහි සාමගල්ල නම් ගමටයි. සාමගල්ල යනු ඒ කාලයේ මොරගල්ල යනුවෙන් හැඳින්වුණු බව ටීකාකරුම පවසයි. [37] මොරගල්ල පිහිටා ඇත්තේ මාතලේ කන්දපල්ලේ කෝරලයේය. මාතුවෙලංග යනු මාතලේ ද විය හැකිය. මෙයින් අදහස් කරන්නේ වළගම්බා රජු මේ ප්‍රදේශයේ ගැවසුණු බවයි. මාතුවෙලංගයට නුදුරු තැනක ඇති පබ්බත විහාරක් ගැන වංශකථා ටීකාකරු සඳහන් කරයි. [38] ඒ කාලයේ මෙහි පැවති පබ්බත විහාරය වර්තමාන අලුවිහාරය ද විය හැකිය. මාතුවෙලංගයේදී රජුට කුපිත්කල මහාතිස්ස තෙරුන් යළි මුණ ගැසුණු බවත් අච්ඡගල්ල විහාරයට ගොස් බුද්ධ පූජාව කළ පසු ඒ හිමි තම ඒ ප්‍රදේශයේ අධිපති වශයෙන් සිටි තනසිව නමැත්තාට වළගම්බා හඳුන්වා දුන් බවත් ඔහුගේ පිළිසරණින් රජු එහි සැඟවී ජීවත් වූ බවත් පැවසේ[39] මෙම අච්ඡගල්ල විහාරය මාතලේ අස්ගිරිය විය හැකිය. අවසානයේ රජුගේ අනන්‍යතාවය ජනතාව දැනගත් පසු තිස්ස තෙරුන් පවසා ඇත්තේ බුද්ධ ධර්මය ආරක්ෂා කළ යු.ත්තේ දෙමළුන් සමඟ නොව අපගේ රජතුමන් සමඟ බවය.

36 Seneviratna, Anuradha, ***The Golden Rock Temple of Dambulla,*** Colombo, 1983, p.24;

36B ***Manorathapurani*** (PTS), Vol. pg. 26, London, 1924

37 *වංසත්ථප්පකාසිනී*, සිංහල අනුවාදය, 493 පිටුව

38 ***Dambulla in Ancient Time***, S. Paranavitana, Vesak, 2523, Dept. of Cultural Affairs, Colombo, 1969, pp. 65-69

39 ***Mahavamsa*** (PTS), London, 1908, Chap. 33:67

එසේ පවසා ජනතා සහයෝගය ද යළි රජුට ලබා දීමට කටයුතු කළ බව කියැවේ. මේ කාරණා නිසා මාතලේ අලුවිහාරයත් ඒ අවට ප්‍රදේශයත් සංගායනාවට හා වට්ටගාමණී රජුගේ ජීවිතයටත් සම්බන්ධකමක් දක්වයි.

<u>දීපවංශය</u> හා <u>මහාවංශය</u> වැනි ඓතිහාසික ග්‍රන්ථවල ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමේ වැදගත් කාරණය වැඩි විස්තර සහිතව සඳහන් නොකර ගාථා දෙකකින් ඒ බව වාර්තා කර තිබීමට ගත් උත්සාහය වුවද වැදගත්ය. මෙවැනි සිද්ධියක් නොසලකා හැරීමට වංශකථා කරුවන් පෙලඹුණේ මහාවිහාරික භික්ෂූන්ට අභයගිරි විහාරයේ කටයුතු හෝ එම පක්ෂය ගත් වළගම්බා රජු ගැන උනන්දුවක් නොතිබුණු නිසා විය යුතුය. සටන්කාමී භික්ෂූන් මහාවිහාරය හැර දමා අභයගිරි විහාරයට එක් වීමත් පිළිවෙත් ආරක්ෂා කිරීමට වඩා ධර්මය ආරක්ෂා කිරීම වැදගත් වශයෙන් ඔවුන් සැලකූ නිසාත් ඒ තත්ත්වය ඇති වන්නට ඇත. එසේම රජවරුන් හා මහඇමතියන් ඇසුරුකරමින් ලාභප්‍රයෝජන ගැනීමට භික්ෂූන් පෙලඹීම නිසාත් මෙතෙක් කල් රජවරුන් මහාවිහාරයේ භික්ෂූන්ගේ අවවාද අනුශාසනාවලට ඇහුම්කම් දුන් පැරණි චාරිත්‍ර බිඳ දමා වළගම්බා රජු කටයුතු කිරීම සහ සසුනේ පරිහානියට හේතු වූ වග මහාවිහාරික භික්ෂූන් කල්පනා කළා ද විය හැකිය. එසේ වුවත් ලක්දිව ශාසනික ඉතිහාසයේ මෙන්ම ලෝක බෞද්ධ ඉතිහාසයේ ද සුවිශේෂ සිද්ධියක් වූ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමේ සිද්ධිය කුමන ආකාරයෙන් හෝ ඉතිහාසයේ වාර්තාගත කර තිබීම වැදගත්ය. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම නිසා සිදු වූයේ බුදුන් වදාළ ධර්මය ශතවර්ෂ ගණනාවක් ඉදිරියට අඛණ්ඩව ආරක්ෂා කර ගැනීමටත් උන්වහන්සේගේ ධර්මය ලෝකයා අතට පත් කිරීමටත් හැකිවීමයි. මානව ඉතිහාසයෙන් සලකා බලන කල ලොව පහළ වූ ශ්‍රේෂ්ඨ ශාස්තෘවරයෙකුගේ ධර්මය ක්‍රිස්තුවර්ෂ ආරම්භයේදීම ග්‍රන්ථාරූඪ කිරීමටත් එය පරම්පරාවෙන් පරම්පරාවට ගෙන ඒමට හැකි වීම බුද්ධිමය ලෝකයේ ඉතා වැදගත් සිද්ධියකි.

අලුවිහාරයේදී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමට පෙර උගත් භික්ෂූන් එකතුව එතෙක් කටපාඩමින් ගෙනා ධර්ම-විනය සසඳමින් සංගායනා කර එකඟත්වයකට පත්වීම ශාස්ත්‍රීය කාර්යයකදී අනුගමනය කළ හැකි නිවැරදිම ක්‍රියා මාර්ගයයි. කල්ලගාම ජනපදයේ මණ්ඩලාරාමයේ පැවතියැයි මනෝරථපූරණිය කියන මේ සංගීතිය (මණ්ඩලාරාමක මහාවිහාරෙ ගන්ථ මමං.......) කෙසේ සිදුවීද? යන්න ගැන තොරතුරු අපට හමු නොවේ. අලුවිහාරයේදී සිදු වී ඇත්තේ මණ්ඩලාරාමයේදී සංසන්දනය කළ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම පමණක්ද? කෙසේ වුවද සංගීතියත් - ග්‍රන්ථාරූඪ කිරීමත් යන සිද්ධීන්



දෙක එකට එක්කර ඒ මගින් පසු කාලයකදී එනම් දහතුන්වන සියවස තරමේදී ආලෝක ලෙනට කීර්තියක් හා යශෝරාවයක් ලබාදීමට හැකි වීම දෛවය විසින් එම ස්ථානයට සිදු කළ අනුග්‍රහයක් විය හැකිය.

ත්‍රිපිටකය පළමුවන සියවසේ ග්‍රන්ථාරූඪ වූ බව <u>දීපවංශය</u> හා <u>මහාවංශය</u> ස්ථිරව පවසනත් මාතලේ අලුවිහාරයේම සිදු වූ බව හෙළිවන්නේ දහතුන්වන හා දහහතරවන සියවස්වලයි. එයින් අදහස්වන්නේ එම පුවත ඓතිහාසික වශයෙන් පිළිගැනීමට නොහැකිය යන්න නොවේ. ජනශ්‍රැතියේ පැවති දෙයක් පසුකාලීනව ලේඛනගත වීම පමණි. අභයගිරි පාර්ශ්වයට අනුග්‍රහය දැක්වූ රජකෙනෙකුගේ සමයේදී සිදු වූ දෙයක් වශයෙන් මේ සිද්ධිය නොසලකා හැරීම එයට හේතු වන්නට ඇත. කෙසේ වුවද අලුවිහාර සංගායනාව හුදෙක් අභයගිරි වාසී භික්ෂූන්ගේම කටයුත්තක් වශයෙන් නොව මහා විහාර - අභයගිරි භේදයෙන් තොරව ථේරවාදී සම්ප්‍රදාය ගරු කළ භික්ෂූන්වහන්සේලාගේ සාමූහික ප්‍රයත්නයක් හා ශාසනික කර්තව්‍යයක් වශයෙන් අර්ථකථනය කිරීම වඩාත් යෝග්‍යය. එයට හේතුව වශයෙන් දැක්විය හැක්කේ ස්මෘති ශක්තියෙන් හෙවත් කටපාඩමින් ගෙනා ත්‍රිපිටක ධර්මය භික්ෂූන් එක්රුස්ව සංසන්දනය කිරීමේ කටයුත්ත අභයගිරි නිකාය ආරම්භ කිරීමට මඳ කලකට ඉහත දී සිදු වූවක් බැවිනි. මෙයට පෙරදැරි වූයේ අනාගතය සඳහා බුද්ධ ධර්මය ආරක්ෂා කර තැබීම විනා අන් කවර හේතුවක් ද නොවේ. මුලදී මහාවිහාර හා අභයගිරි භික්ෂූන් වෙන වෙනම ජීවත් වුණත් දෙපාර්ශවය අතර ධර්ම විනය අතින් භේදයක් තිබුණේ නැත. මහාතිස්ස හිමිට දුන් දඬුවම විනය විරෝධී බව පමණය ඔවුන් කීවේ.[40] මාතලේ අලුවිහාරයේ සිද්ධ වූ ග්‍රන්ථාරූඪ කිරීමේ මහඟු කාර්යය සම්බන්ධයෙන් වළගම්බා රජුගෙන් ලැබුණු අනුග්‍රහයක් නැත. එම සද්කාර්යය හුදෙක් ශාසනයේ චිරස්ථිතිය අපේක්ෂා කළ මහා සංඝරත්නයේම උනන්දුව, ධෛර්යය හා කැපවීම නිසා සිදු වූවකි. එහෙත් ඒ සඳහා අනුග්‍රහය දක්වනු ලැබුයේ නමක් සඳහන් නොවන ප්‍රාදේශීය ජනනායකයෙකු විසිනි. එකල රජකම අහිමි වී අප්‍රසිද්ධව මේ ප්‍රදේශයේ සැරිසරමින් සිටි වළගම්බා රජුට කළ හැකිව තිබූ එකම කාර්යය වූයේ තමන්ට හැකි හැම උපකාරයක්ම ඒ සඳහා ලබා දීම පමණකි. සමහරවිට භික්ෂූන් මේ ස්ථානයට එක් රැස්වුණේ ද රජු මෙහි සැඟවී සිටිනා බව දැන ගත්තායින් පසුව විය හැකිය. භික්ෂූන්ගේ ආරක්ෂාව යටතේ සිටි වළගම්බාවන්ට සතුරන්ගෙන් හානියක් සිදු නොවන්නට ඇත. ධර්මය රකින්නේ දමිළයා ද නැතහොත් අපගේ වළගම්බා රජතුමා දැයි

[40] Rahula Thera, Walpola, ***History of Buddhism in Ceylon***, Colombo, 1956, p. 84

එදා තිස්ස තෙරුන් ජනතාවගෙන් ප්‍රශ්න කලේ ද ඒ හේතුවෙනි. (කාරෙතුං කෙහි සක්කානු ජිනසාසන පග්ගහං දම්ලෙහි වාථ රක්ඛිදා? ඉති පුට්ඨාතු තෙපන)[41]

වට්ටගාමණීඅභය රජු යුද කිරීමට සේනා රැස් කළ කාලය වන විට අනුරාධපුරයේ රජ කළ දෙමළුන්ගේ බලය බිඳී තිබුණි. මේ යුගයේ එහි රජ කළ දෙමළ රජු දාඨිය යි.

අලුවිහාර ත්‍රිපිටක ග්‍රන්ථාරූඪකරණයේ ඓතිහාසික වැදගත්කම ගැන මෙසේ සටහන් තබන අතර ඒ මගින් උදා වූ ශාසනික ප්‍රබෝධය ගැන කරුණු ස්වල්පයක් දැන් සලකා බැලීම උචිතය. අද ලෝකයේ ඇති බෞද්ධ ත්‍රිපිටකවලින් සම්පූර්ණව තිබුණේ පාලි ත්‍රිපිටකය පමණක් බව අග්ගමහා පණ්ඩිත බුද්ධදත්ත හිමියෝ වරක් ප්‍රකාශ කළහ. එවැනි පරිපූර්ණ ත්‍රිපිටකයට උරුමකම් කීමට අපට හැකි වී තිබුණේ එදා ආලෝක ලෙනෙහිදී තෙවලා දහම ග්‍රන්ථාරූඪ කිරීම නිසායි. ඊට පෙර සීහළට්ඨකථා සම්පාදනය වී තිබුණු බව පැහැදිලි කරුණක් වුව ද අඩු වශයෙන් ඒවායින් කිහිපයක් හෝ ඒ වන විටත් ග්‍රන්ථාරූඪ වී තිබෙන්නට ඇත. ධර්මය ක්‍රමවත්ව ග්‍රන්ථාරූඪ කිරීමේ කර්තව්‍යය අලුවිහාර සංගායනාවේදී සිදු වූ කාර්යයයි. තවත් ලෙසකින් පවසතොත් ධර්ම පුස්තක සංගායනා කොට අටුවා සංශෝධනය කර ලියා තබා බෙදා හැරීමයි. අලුවිහාර සංගායනාවට සහභාගී වූ පන්සියයක් භික්ෂූන් කලේ එවක ස්වල්ප දෙනෙකු දැන සිටි බුද්ධ වචනය වැඩි දෙනා සතු වන අයුරින් ක්‍රමවත්ව සකස් කිරීමයි.

මුඛ පරම්පරාගත සාහිත්‍යය මෙන් නොව ලිඛිත සාහිත්‍යය වඩා කෙටි කාලයකදී ව්‍යාප්ත වේ. සංගීතියෙන් පසු ලිඛිත පිටපත් මහාවිහාරයේත් දිවයිනේ වෙනත් විහාරාරාමයන්හිත් තැන්පත් කරන්නට ඇත. මුඛවාදයෙන් සැමදා ත්‍රිපිටකය ආරක්ෂා කිරීමට නොහැකි බව දැන ගත් භික්ෂූන් අභාග්‍ය සම්පන්න සමයකදී එය රැක ගැනීම උදෙසා මෙසේ ඒවා ග්‍රන්ථාරූඪ කළා විය හැකිය. ඇතැම් භික්ෂූහු පිටරට නොගොස් මෙරටෙහිම නැවතී යන්තම් ආහාරයකින් ජීවිතය රැක ගනිමින් තමන් උගත් ධර්මය කටපාඩමින් කියමින් කල්ගත කළහ. එසේ එකට ජීවත් වූ සැට නමක් භික්ෂූන් වහන්සේ හිටගෙන හෝ හිඳගෙන පාඩම් කියන්නට වූ කල ශක්තිය මඳවී වැලි ගොඩක් ගසා එය වටේ වැතිර හිස් ළංවන සේ වැලි ගොඩ උඩ තබා ගෙන පොත් හැදෑරූහයි පැවසේ. චූලශිව තෙරුන්ගේ ජීවිත කථාව පවසන තැනේදී එක් මිනිසෙක් එතුමන් දැඩුරුඹය සමීපයට කැඳවාගෙන ගොස් කොළ වර්ග කා ජීවත් වන මිනිසුන් වසන තැනක් පෙන්වූ

41 *Mahavamsa*(PTS), Chap. 33:74



සැටි ද විස්තර වේ. ඉසිදත්ත හා මහාසෝණ හිමිවරුන් ඇළ ජනපදයට ගොස් එහිදී ඇට රැගෙන ඉවත දැමූ මී ගෙඩිවල පොතු වළඳා සත් දිනක් ගත කොට එතැනින් සේරුවිලට ගොස් මානෙල් දඬු වළඳා ජීවත් වූ සැටි ද විස්තර වේ.[42] දුර්භික්ෂයේ ප්‍රමාණය එබඳුය. මේ දුෂ්කර කාලපරිච්ඡේදය ගැන තොරතුරු අභිධර්ම පිටකයේ විභංගට්ඨකථාව වූ සම්මෝහවිනෝදනියෙහිත් සඳහන් වේ.[42B] ක්‍රිස්තු වර්ෂ පළමුවන සියවසේදී ග්‍රන්ථධුරය සමාජයේ ලබා තිබූ පිළිගැනීම කෙබඳු වී දැයි සිතා ගැනීමට ඉවහල්වන සාධකයන් <u>මහාවංශයෙන්</u> හමු වේ. ග්‍රන්ථධුරය සංඝයා විසින් අනුගමනය කරනු ලැබිය යුතු නියමිත වෘත්තියකැයි භාතිකාභය රජුගේ කාලයේදී පිළිගැනුණේය. ග්‍රන්ථධුරය උසුලන භික්ෂූන්ට දන් පිළිගැන්වීමට කටයුතු සැලසීමෙන්ද ඒ බව හෙළි වේ.

ආලෝක ලෙන සංගායනාවට සහභාගී වූ භික්ෂූන් සම්පූර්ණයෙන්ම අභයගිරි විහාර වාසීන් යයි වරදවා ගත යුතු නොවේ. එයට හේතුව ධර්මය සංසන්දනය කිරීමට එක් වූ භික්ෂූන් අතර ඒ වන විට භේදයක් හට ගෙන නොතිබුණු බැවිනි. මෙහි පැවති අස්ථිර දේශපාලන වාතාවරණය ද දුර්භික්ෂය ද හේතු කොට ගෙන අනුරාධපුරය අතහැර දකුණු ඉන්දියාවට හා ලක්දිව මලයදේශයට ද පදිංචියට ගොස් ආපසු පැමිණි භික්ෂූන් මෙම කාර්යයට සම්බන්ධ වූ අතර මහාවිහාරය හා අභයගිරිය අතර පසුව ඇති වූ මතභේදයත් මෙම සංගායනාවත් අතර සම්බන්ධයක් නැත. මැන්දිස් රෝහණධීර මහතා ප්‍රකාශයට පත් කළ <u>අස්ගිරි තල්පත</u> අනුව වුවත් පෙනී යන්නේ මෙම සංගායනාව අභයගිරි විහාරය ආරම්භ කිරීමට හේතු වූ තිස්ස නම් භික්ෂුවගේ ක්‍රියා කලාපය නිසා සිදු වූවක් බවයි. තිස්ස තෙර මහාවිහාරයට විපක්ෂව අභයගිරි නිකාය ඇති කරගත් තැනේදී මතු ශාසනාරක්ෂාව නොපවත්නා කාරණාව දැක මහත් සංවේගයට පැමිණ පංචමහාවාස නිවාසී රහතන්වහන්සේලා ලෝවාමහාපායට රැස්ව මහා සංඝ සම්මුතිය සැදී ත්‍රිපිටකත්‍රය ග්‍රන්ථාරූඪ කොට ශාසනාරක්ෂාව කර තබන්නට කතිකා කරගත් බවත් ඒ අනුව මහාවිහාරබද ථූපාරාම නිවාසී කුත්තගත්තතිස්ස මහ තෙරුන් වහන්සේ ප්‍රධාන පන්සියයක් රහතන් වහන්සේලා මාතුල දනව්වේ අලුලෙනට රැස්ව එදා කටපාඩමින් ගෙනා ත්‍රිපිටකත්‍ර පාලි ධර්මය බුදුන් පිරිනිවිය අවුරුදු **456**ක් ගිය කල සංගායනා කොට ග්‍රන්ථාරූඪ කළ බවත් සඳහන් වේ.

42 බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, *පාලි සාහිත්‍යය*, 21-22 පිටු

42B ***Sammohavinodani,*** (PTS), London, 1923, pp. 445-448

මෙකී විස්තරය සම්පූර්ණයෙන් පිළිගැනීමට බාධකය වන්නේ අස්ගිරි තල්පතෙ විශ්වාසනීයත්වය පිළිබඳව ඇති සැකය හා ඉහත දැක්වූ පරිදි සාධක රහිත ආගන්තුක ඉතිහාස කරුණුද හේතුවෙති. ග්‍රන්ථාරූඪ සංගීතියේ මූලසූත හොබවන්නට ඇත්තේ නිකාය සංග්‍රහයේ පැරණි ආචාර්ය ලේඛනයේ අවසානයේ දැක්වෙන ශිව නම් වූ තෙරුන් වහන්සෙ විය යුතුය.[43] උන්වහන්සේ චූකලී උපාලි මහරහතන් වහන්සේගෙන් පැවත එන විනය භාණක භික්ෂු පරම්පරාවේ කෙනෙකු වන අතර මහා විහාරයට අයත් තෙර නමක්ද දු බවට සැකයක් නැත. අස්ගිරි තල්පතින් වුවත් පැහැදිලි වන්නේ මෙම ධර්ම සංගායනාද මහාවිහාරික භික්ෂූන්ගේ කටයුත්තක් බවය. එහෙත් ප්‍රශ්නය වන්නේ එදා වට්ටගාමිණී රජු දවස ග්‍රන්ථාරූඪ වූ ත්‍රිපිටක ධර්මයත් තුන්වන ධර්ම සංගායනාවේදී සම්මත දු ධර්මයත් අතර යම් යම් වෙනස්කම් තිබුණා ද යන්න තොරා බේරා ගැනීමයි. එයට ක්‍රමයක් නැත. කෙසේ වුවද එදා ධර්ම විනය පිළිබඳව ලක්දිව භික්ෂූන් අතර පැවති වාද විවාද අනුව ග්‍රන්ථාරූඪ ධර්මයේ යම් යම් වෙනස්කම් තිබුණා යැයි පිළිගැනීමට සිදු වේ.

ලක්දිව පසුකාලීන ශාසනික ඉතිහාසයේ සිදුවීම් දෙස බලන කල දැඩි ශික්ෂණයෙන් මිදී ඉඩකඩම් භුක්ති විඳීමට තරම් භික්ෂූන් නිදහස් ජීවිතයක් ගත කළේ අභයගිරි විහාරය ආරම්භ කිරීමට තුඩු දුන් පෞද්ගලික භුක්තියට ලැබුණු අවසරය නිසා විය යුතුය. ධර්ම සංගායනාවක් පැවැත්වීමෙන් වුවත් ඊට පෙර පැවති ශාසනික ශික්ෂණය ආරක්ෂා කිරීමට මේ නිසා නොහැකි වූ බව ඉන් අනතුරු කාලවල සිදුවීම් විමසීමෙන් පෙනී යයි. ලක්දිව බුදුසසුන පිහිටුවාලීමෙන් පසු භික්ෂූන් අතර යම් මත භේදයක් සිදු වූයේ සියවස් තුනකින් පසු විනය ප්‍රශ්නයක් මුල් කරගෙන මහා විහාරයෙන් වෙන් වී පන්සියයක් භික්ෂූන් විසින් ආරම්භ කරන ලද අභයගිරි විහාරයෙන් බව පැහැදිලිය. මහාවිහාරික භික්ෂූන්ගේ චෝදනාව වූයේ පෞද්ගලික පරිභරණය පිණිස විහාරාරාම පිළි ගැනීම හේතුවෙන් අභයගිරි භික්ෂූන් කුල සංසගත දෝෂය සිදු කළ බවය. එබැවින් ඔවුන් මහා විහාරයෙන් පළවා හැරිණි.[44] ඒ වට්ටගාමිණී රජු දවස තිස්ස නම් භික්ෂුවක් මුල් කරගෙන සිදු වූවකි (ක්‍රි.පූ. 43-29). අභයගිරි විහාරය ඇරඹූ ඔවුන පසුව ධර්මරුචිකයන් වශයෙන් හැඳින්වූයේ වෛතුල්‍යවාදය පිළිගත් නිසාය.

ඉන් පසු තවත් වර්ෂ කිහිපයකින් භාතිකාභය රජු දවස (ක්‍රි.ව. 35-68) මෙකී විහාර දෙක අතර තවත් විනය ප්‍රශ්නයක් මුල් කරගෙන භේදයක් ඇති වූ වග

43 *නිකාය සංග්‍රහය*, 73 පිටුව

44. *මහාවංශය*, පරි. 33:95



සමන්තපාසාදිකාව පවසයි. සංඝයා අතර ඉන්පසු මතභේදයක් ඇති වූයේ ක්‍රි.ව. 269 වෝහාරික තිස්ස රජු දවසය. මහාවංශය පවසන පරිදි මේ රජතුමා වෛතුල්‍යවාදය මර්දනය කළේය. නැවතත් මහාවිහාර භික්ෂූන් අතර මතභේද ගෝඨාභය (309-22) හා මහසෙන් රජු (334-62) දවස උග්‍ර වූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ජේතවන විහාරය ආරම්භ වී මෙසේ නිකාය තුනක් බවට පත් විය. හයවන සියවසේ සිලාකාල රජු දවස මහායානය හිස එසවූ අතර පළමුවන සේන රජු දවස වජ්‍රවාදය ද මෙහි ආරම්භ විය. මේ අතර නීලපට දර්ශනය නම් තාන්ත්‍රික දර්ශනයක් නව වැනි සියවසේදී ම ආරම්භ විය. මේ සියලු අභියෝගයන් මැද ථේරවාදී මහාවිහාරය බුද්ධ ධර්මයත් ශාසනයත් ආරක්ෂා කරමින් අචලව හා ස්ථිරව නැගී සිටියේය.[45] කුමාරදාස රජු දවස (ක්‍රි.ව. 508-516) සියලුම වැදගත් අටුවා ග්‍රන්ථ සම්පාදනය වී හමාර විය. එසේම ත්‍රිපිටකයේ සංශෝධිත සංස්කරණයක්ද මේ කාලය වන විට සම්පූර්ණ විය. මෙයද හඳුන්වා ඇත්තේ ධර්ම සංගායනාවක් වශයෙනි.[46]

මෙසේ විවිධ කොටස්වලට බෙදී තිබුණු බුදු දහමත් තුන් නිකායත් වශයෙන් වෙන්ව සිටි භික්ෂූනුත් සමගි කරවාලීමට දොළොස්වැනි සියවසේදී මහාපරාක්‍රමබාහු රජුට හැකි වූයේ ධර්මය හා විනය ග්‍රන්ථාරූඪව ආරක්ෂා වූ නිසාය. භික්ෂු ශාසනයේ පැවැත්ම ශාසනයේ පැවැත්මයි. එබැවින් විනය ආරක්ෂා කිරීම උදෙසා කලින් කලට කතිකාවත් අවශ්‍ය විය. ඒවා ශාසන හා විහාර කතිකාවත් යනුවෙන් කොටස් දෙකකට බෙදන අතර ශාසන කතිකාවත් මගින් පොදුවේ මහාසංඝයා උදෙසා ව්‍යවස්ථා පැනවුණු අතර විහාර කතිකාවලින් විහාරවල මනා පරිපාලනයක් සිදු විය. මේ අනුව සලකා බලන කල පොළොන්නරුවේ මහ පැරකුම්බාවන්ගේ ගල්විහාර කතිකාවතත් නිශ්ශංකමල්ලගේ හැටදාගේ කතිකාවතත් දෙවන පරාක්‍රමබාහුගේ දඹදෙණි කතිකාවතත් හයවන පරාක්‍රමබාහු කතිකාවතත් මහනුවර යුගයේ කීර්ති ශ්‍රී රාජසිංහ කතිකාවත හා ශ්‍රී රාජාධිරාජසිංහ කතිකාවතත් ලක්දිව ශාසන ඉතිහාසයේ ශාසන කතිකාවත් වශයෙන් සැලකිය හැකිය. මෙකී සියළු කතිකාවත්ට පදනම වූයේ ත්‍රිපිටක ධර්මයයි.[47]

ක්‍රි.ව. පළමුවන සියවසේදී ත්‍රිපිටකය හා අටුවා ග්‍රන්ථාරූඪ වීමත් සමඟම දේශීය බුදු දහමට පදනම වැටුණි. බුදුන් වහන්සේ දේශනා කළ අති උතුම් ධර්මය පදනම්

45 ***University History of Ceylon,*** Vol.1, pt.1, Colombo, 1959, පිටු. 381-385

46 එම, පිටු 380-82, ***Culavamsa***, Chap. 40: 1-2

47 සූරවීර, ඒ. වී., *සිංහල කතිකාවත් හා භික්ෂු සමාජය*, කොළඹ, 1971, පිටු 33-60

කරගෙන ලාංකික සමාජයට හා චින්තනයට ගැලපෙන අයුරින් එය සකස් වී ශ්‍රී ලාංකික අනන්‍යතාවයකින් යුතුව ථෙරවාදී බුදුදහම ලෝකය පුරා ව්‍යාප්ත විය. දේශීය බුදු දහමේ ලක්ෂණ පසු කාලීන පාලි අටුවාවන්හි දක්නට පුළුවන. අවුරුදු දෙදහස් තුන්සියයක ලක්දිව බුද්ධ ශාසන ඉතිහාසය දෙස බලන කල එය ස්ථිර පදනමකින් යුතුව ගොඩ නැගෙන්නට පටන් ගත්තේ ත්‍රිපිටක ග්‍රන්ථාරූඪයෙන් පසුවයි කියා කිව හැකිය.